// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2396/62 - 2024 අගෝස්තු මස 10 වැනි සෙනසුරාදා - 2024.08.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/COM/01/2019/337.

**කාර්මික ආරවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.11.23 දිනැති හා අංක 2359/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අතුරුගිරිය, සමනල මාවත, අංක 46/12ඒ හි පදිංචි කේ. එස්.ටී.එම්. කුලරත්න මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234 හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 70/2023 හා 2024.06.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුලි මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 42434 - 22 (2024/08)

**කොළඹ බේරුම්කරණය හා කාර්මික අධිකරණ අංශයේ දී**

IR/COM/01/2019/337

නඩු අංකය : A/70/2023

කේ.එස්.ටී.එම්. කුලරත්න මයා,
අංක 46/12ඒ,
සමනල මාවත,
අතුරුගිරිය

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968) අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956) ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

"මූලික විමර්ශන නිලධාරියා පත් කිරීම අනීතික බවට කරුණු දැක්වීම විධිමත් විනය පරීක්ෂණය ආරම්භයේ දී සිදු නොකිරීම නිසා එම සිද්ධීන්ට අදාලව පමණක් වන නියෝග අවලංගු නොකිරීම මගින් පැමිණිලිකරුට (කේ.එස්.ටී.එම්. කුලරත්න මයා) අසාධාරණයක් වී ඇත්ද හා එසේ වී නම් ලැබිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

පෙනී සිටීම :-

පළමු පාර්ශ්වය වෙනුවෙන් :- 1. ඉල්ලුම්කරු සහ ඔහුගේ නියෝජිත එම්.කේ. හේමපාල

දෙවන පාර්ශ්වය වෙනුවෙන්:- 1. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලන අංශයේ දිනූෂි චතුරිකා මිය.
2. නීතිඥ රොහාන් විජේසේන මහතා.

මෙම ආරාවුල ප්‍රථමවරට 2023.12.04 වන දින කැඳවූ අතර එහිදී පළමු පාර්ශ්වය විසින් ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් පිටපත් තුනකින් යුතුව සිය පළමු ප්‍රකාශය බේරුම්කරණයේ දී ගොනු කරන ලදි. දෙවන පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය බේරුම් කරණයට ගොනු කිරීම සඳහා කල් ඉල්ලා සිටි අතර ඒ සඳහා 2023.12.08 වන දින හෝ ඊට ප්‍රථම බේරුම්කරණ කාර්යාලයට තම ප්‍රකාශය ගොනු කිරීමට දෙවන පාර්ශ්වයට නියෝග කළ අතර ඉන් පසුව එහි පිටපතක් බේරුම්කරණ කාර්යාලය විසින් ලියාපදිංචි තැපෑලෙන් පළමු පාර්ශ්වයට යැවීමට කටයුතු කරන ලෙසටද දන්වා සිටින ලදි.

මෙම නඩුව 2023.01.09 වන දින නැවත කැඳවූ අතර, එහිදී පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත එම්. කේ. හේමපාල මහතා ප්‍රකාශ කර සිටියේ පැමිණිලිකරුට එරෙහි මූලික පරීක්ෂණය රජයේ විශ්‍රාමලත් නිලධාරියෙකු විසින් පවත්වා ඇති බවත් එය ආයතන සංග්‍රහයේ 02 වෙලුමේ 45 වන පිටුවේ 13 වන වගන්තිය මුලුමනින්ම උල්ලංඝනය කිරීමක් බවත් ය. ඉහත සඳහන් වගන්තිය අනුව රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු මෙවැනි අවස්ථාවක මූලික පරීක්ෂණය සිදුකල යුතු බවට පැහැදිලිව සඳහන්ව ඇති බවටද වැඩිදුරටත් කරුණු දැක්වීය. තවද මීට පෙර මෙම ඉල්ලුම්කරුට එරෙහිව පැවැති වෙනත් විනය පරීක්ෂණයක දී මේ කරුණු මතම මූලික විරෝධතා දැක්වූ අතර එහිදී එම විරෝධතාවය පිළිගෙන පැමිණිලිකරුට එරෙහි සියලු චෝදනාවලින් නිදොස් කර ඇති බවද දැනුම් දුනි. නමුත් මෙම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති කරුණු විමර්ශනයේ දී ඉදිරිපත් කළ විරෝධතා නොසලකා ඉල්ලුම්කරුට දඬුවම් තුනක් පමුණුවා ඇති බව ප්‍රකාශ කරන ලදී.

ඉන්පසුව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ පළමු ප්‍රකාශය සඳහා පිළිතුරු ප්‍රකාශයක් 2024.01.30 දින හෝ ඊට පෙර බේරුම්කරණ අංශයට ලබාදෙන ලද පළමු පාර්ශ්වයට නියෝග කළ අතර එම පිළිතුරු ප්‍රකාශය බේරුම්කරණ අංශය වෙත ලැබුණු වහාම දෙවන පාර්ශ්වය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවන ලෙස දන්වා සිටින ලදී.

මෙම නඩුව 2024.03.12 වන දින නැවත කැඳවූ අතර බේරුම්කරණ අංශයට ඉදිරිපත් කරන ලද ප්‍රති පිළිතුරු ප්‍රකාශය සමඟ A 4 සහ A 4 - (b) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛන සම්බන්ධයෙන් බේරුම්කරණ අධිකරණයේ අවධානය යොමු කරන ලදී. තවද ඉල්ලුම්කරු විසින් අවස්ථා තුනකදී මෙම විනය නියෝගය සම්බන්ධයෙන් ලිඛිතව ආයතනයේ සභාපතිතුමා ඇතුළු වගකිව යුතු නිලධාරීන් වෙත අභියාචනා ඉදිරිපත් කල බවට ඉල්ලුම්කරුගේ නියෝජිත එම්.කේ. හේමපාල ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව ඉල්ලුම්කරුට කිසිදු ප්‍රතිචාරයක් දෙවන පාර්ශ්වය විසින් නොදැක්වූවත් ආයතනයේ සේවකයින්ගේ යම් යම් ප්‍රශ්න හා දුක් ගැනවිලි සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සය පුද්ගල කමිටුවක් පත්කළ බවද එහිදී පැමිණිලිකරුගේ අභියාචනය ද සලකා බැලීමට කටයුතු කළ බවද තවදුරටත් ප්‍රකාශ කර සිටින ලදී. ඒ අනුව එම කමිටුව විසින් ආයතනයේ සභාපතිතුමාට නිර්දේශ කර ඇත්තේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් පැවති විනය චෝදනා ගැන මූලික විමර්ශනය කර ඇත්තේ ආයතන සංග්‍රහයේ 02 වෙලුමේ 45 වන පිටුවේ 13 වන වගන්තිය ප්‍රකාරව නිලධාරියෙක් නොවන බැවින් එසේ නීත්‍යානුකූලභාවයක් නොමැති කෙනෙකු විසින් කරනු ලැබූ මූලික විමර්ශනය සහ අදාල තීන්දු ඒ ආකාරයටම බල රහිත වන බවත්ය.

තවද, එම කමිටුවේ නිර්දේශ ආයතනයේ සභාපතිතුමන් විසින් පිළිගෙන ඒවා ක්‍රියාත්මක කරන ලෙස 2020.08.20 දාතමින් සාමාන්‍යාධිකාරිතුමා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන/මානව සම්පත්) වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත් නමුත් එම නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බවත් පැමිණිලිකරුගේ නියෝජිත බේරුම්කරණ අධිකරණයේ දී ප්‍රකාශ කරන ලදී. මෙහිදී, පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රති පිළිතුරු ප්‍රකාශයට සහ එදින බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් පිලිගත හැකි ලිඛිත සාක්ෂි සහිතව ලිඛිත ප්‍රකාශ පිටපත් තුනකින් සති දෙකක් ඇතුලත බේරුම්කරණ අංශයට යොමු කරන ලෙස දෙවන පක්ෂයට නියම කරන ලදී.

නැවතත් මෙම නඩුව 2024.04.26 වන දින කැඳ වූ අතර දෙවන පාර්ශ්වය විසින් පෙර නඩු දිනය වූ 2024.03.12 වන දින නියෝග කල පරිදි ඉදිරිපත් කර තිබූ ලිඛිත ප්‍රකාශය සැලකිල්ලට භාජනය කරන ලදී. ඒ අනුව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටින්නේ ආයතන සංග්‍රහයේ අදාළ වගන්ති අනුව මූලික විමර්ශන සඳහා විශ්‍රාමික රජයේ නිලධාරියෙකු පත් කිරීමට නොහැකියාවක් ඇති බවට හෝ අනීතික බවට කිසිදු වගන්තියක් හෝ උපවගන්තියක දක්වා නොමැති බවත්ය. තවද අදාළ විනය පරීක්ෂණයේ දී ඉල්ලුම්කරුගේ රැකවරණ නිලධාරි විසින්, මූලික විමර්ශනය සිදු කලේ ආයතන සංග්‍රහයට පටහැනිව විශ්‍රාමික නිලධාරියෙකු බවට කිසිදු විරෝධතාවක් ඉදිරිපත් නොකල බවත් එමෙන්ම, මෙකී විධිමත් විනය පරීක්ෂණය අවසානයේ දී එනම් 2018.05.26 වන දින විනය පරීක්ෂණය පැවැත්වූ ආකාරය සම්බන්ධයෙන් සෑහීමකට පත්වන බව සඳහන් කර එය තහවුරු කරමින් අත්සන් තබා ඇති බවත් ය.

එම ප්‍රකාශය මගින් තවදුරටත් දන්වා ඇත්තේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විනය බලධාරිත්වය සභාපති වෙත පැවරී ඇති බවත්, කාර්යාංශය විසින් සිදුකරනු ලබන මූලික විමර්ශන සඳහා රජයේ විශ්‍රාමික නිලධාරීන් යොදාගනු ලබන බවට ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර ඇති බවත්ය. එහි දී පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ උප සභාපතිගේ මූලිකත්වයෙන් පත් කල කමිටු අනුමැතියත් පැමිණිලිකරුගේ විනය ලිපිගොනුව වෙත ලැබී නොමැති බවත්, පරිපාලන හා මානව සම්පත් අංශය විසින් අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී නොමැති බැවින් එම නිර්දේශ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමක් සිදු වී නොමැති බවත් සඳහන් කර ඇත. දෙපාර්ශ්වය විසින් අවසන් ලිඛිත දේශන 2024.05.29 වන දින බේරුම්කරණ අධිකරණයට ගොනු කරන ලෙස එහි දී නියම කරන ලදී.

2024.05.29 වන දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී අවසන් ලිඛිත දේශන දෙපාර්ශ්වය විසින් විවෘත අධිකරණයේ දී ගොනු කරන ලදී. මෙහි දී පළමු පාර්ශ්වය විසින් තම අවසන් ලිඛිත දේශන සමඟ අමුණා ඇති A 4 ඇමුණුම අධිකරණය විසින් සැලකිල්ලට ගන්නා ලදී. එහි දී ආයතනයේ සාමාන්‍යාධිකාරී විසින් 2023.03.22 දාතමින් නිකුත් කර ඇති අභ්‍යන්තර උපදෙස් පත්‍රිකා (පරිපාලන) - 03/2023 මගින් පළමු පාර්ශ්වය විසින් මෙම නඩුව ආරම්භයේ දීම පෙන්වා දුන් පරිදි, ආයතනයේ මූලික විමර්ශන සිදු කිරීමට ආයතන සංග්‍රහයේ 02 වෙලුමේ 45 පිටුවෙහි 13 වන වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ඇති සේවයේ නියුතු මාණ්ඩලික සේවයේ නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවා ඇත.

මෙම නඩු විභාගයේ දී පැහැදිලිව පෙනී යන කරුණු වනුයේ,

01. පැමිණිලිකරුට එරෙහි මූලික විමර්ශනය කිරීම සඳහා ආයතන සංග්‍රහයේ අදාල වගන්ති අනුව සුදුසු රජයේ නිලධාරියෙකු පත්කර නොමැති බවත්,
02. මීට පෙර පැමිණිලිකරුට එරෙහිව පැවැති විනය පරීක්ෂණයකදී මූලික විමර්ශන නිලධාරියා පත්කිරීම අනීතික බවට මෙවැනිම මූලික විරෝධතාවක් ඉදිරිපත් කළ අවස්ථාවකදී අදාළ විනය නියෝගය අවලංගු කළ බවත්,
03. දෙවන පාර්ශ්වය මූලික විමර්ශන නිලධාරියා වශයෙන් විශ්‍රාමික නිලධාරීන් පත් කිරීම ආයතන සංග්‍රහයට අනුව අනීතික නොවන බවට කරුණු ඉදිරිපත් කළත් පසුව කරුණු තේරුම් ගෙන මූලික විමර්ශන නිලධාරීන් වශයෙන් මාණ්ඩලික නිලධාරීන් පත්කිරීම සඳහා 2023.03.22 දාතමින් සාමාන්‍යාධිකාරී විසින් අභ්‍යන්තර උපදෙස් පත්‍රිකාවක් නිකුත් කර ඇති බවත්,
04. ආයතනය් උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති සේවකයන්ගේ ප්‍රශ්න හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා පත්කොට තිබූ කමිටුවේ නිර්දේශ ආයතනයේ විනය බලධාරියා වූ සභාපතිතුමාව අනුමත කර අදාල අංශයට ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග දී තිබියදීත්, පැමිණිලිකරු සම්බන්ධයෙන් නියෝගය ක්‍රියාත්මක කර නොතිබූ බවත් ය.

**ප්‍රදානය**

මෙම ආරාවුලට අදාලව ඉදිරිපත් කල සියලු සාක්ෂි සහ ලිඛිත ප්‍රකාශයන් අනුව පළමු පාර්ශ්වය විසින් බේරුම්කරණ අධිකරණයෙන් ඉල්ලා සිටි සහනය වූ මූලික විමර්ශන නිලධාරියා පත් කිරීම අනීතික බවට කරුණු දැක්වීම විධිමත් විනය පරීක්ෂණය ආරම්භයේ දී සිදු නොකිරීම නිසා මෙම සිද්ධීන්ට අදාලව පමණක් වන නියෝග අවලංගු නොකිරීම මගින් පැමිණිලිකරුට අසාධාරණයක් වී ඇති බවට පැහැදිලිව සනාථ වන හෙයින් එකී විනය නියෝගය බල රහිත කරන ලෙසත් ඒ අනුව එමගින් පනවා ඇති සියලු දඬුවම් අවලංගු කරන ලෙසත් නියම කරමි.

ඒ අනුව විනය නියෝගය මගින් විලම්භනය කරන ලද වැටුප් වර්ධක දෙක විලම්භනය කල දින සිට නැවත ලබා දීමට කටයුතු කිරීම හා මාසික වැටුපෙන් අය කිරීමට තීරණය කළ රු. 390,000ක මුදලින් මෙතෙක් අය කර ගන්නා ලද සම්පූර්ණ මුදල වන රු. 325,000 ක (තුන්ලක්ෂ විසිපන්දහසක) මුදල ඇතුලුව සියළු ගෙවීම් මෙම ප්‍රදානය ගැසට්ගත කළ දින සිට මසක් ඇතුළත පළමු පාර්ශ්වයට ගෙවීම සිදුකර ඒ බව නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**රමාල් අයි සිරිවර්ධන,**
බේරුම්කරු.

2024 ජුනි මස 03 වන දින,

EOG 08 - 0125

---

මගේ අංක : IR/COM/01/2022/37.

**කාර්මික ආරවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.22 දිනැති හා අංක 2320/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.02.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බෙම්මුල්ල, බඳුවතුගොඩ, අංක 32/ඒ/1 හි පදිංචි කේ.ඒ. නිලන්ත මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 24/2023 හා 2024.04.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය : A/24/2023

IR/COM/01/2022/37

කේ. ඒ. නිලන්ත මයා,
අංක 32/ඒ/1, බදුවතුගොඩ,
බෙම්මුල්ල

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**අතර කාර්මික ආරාවුල**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් බටුවත්ත, නාරංගොඩ පාළුව, නො. 501 හි පදිංචි නීතිඥ පාලිත සේනාධීර වන මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වසර පහක් (05) ඩිපෝ මාර්ග පරීක්ෂක (**VI** ශ්‍රේණියේ) තනතුරේ සේවය කරන ලද කේ. ඒ. නිලන්ත මහතාට 2019.12.14 දින සිට ඩිපෝ අධිකාරී විසින් සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදීම මගින් ඒ මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදු ව තිබේ නම් හිමිවිය යුතු සහන කුමක්ද යන්නත් පිළිබඳව වේ."

පෙනී සිටීම :-
පළමු පාර්ශ්වය සිටී :- පළවන පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත එම්.කේ. හේමපාල මහතා පෙනී සිටී.

දෙවන පාර්ශ්වය සිටී :- දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරී ශානිකා ගාල්ලගේ මහත්මිය සමඟ නීතිඥ යසාරා කෝදාගොඩ මහත්මිය පෙනී සිටී.

**ආරාවුලට අදාළ පසුබිම :**

පළවන පාර්ශ්වය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 1992 දෙසැම්බර් මස 14 වන දින කොන්ත්‍රාත් පදනම යටතේ බස් කොන්දොස්තරවරයෙකු ලෙස පත්වීමේ ලිපිය ලැබී ඇති අතර ගම්පහ ප්‍රාදේශීකයේ කඩවත ඩිපෝවේ සේවය කරමින් සිටිය දී 2019.12.17 වන දින ඩිපෝ අධිකාරිවරයා රාජකාරි ස්ථානයට ඇතුල්වීමට ඉඩ නොදී "තමුසේ මීට පසුව මෙහෙ රැකියාවට එන්න ඕනේ නැහැ" යනුවෙන් රැකියාවෙන් එළවන ලද බවත් ඉන් අනතුරුව විටින් විට කකුල් දෙකේ මතුවන රත්කවාතේ රෝගය සම්බන්ධයෙන් ඇවිද ගැනීමට පවා නොහැකි අවස්ථාවල වෛද්‍ය ප්‍රතිකාර ලැබූ බවත් තවද සේවා යෝජකයා වෛද්‍ය සහතික ඉදිරිපත් කල බවත් පළවන පාර්ශ්වය කියා සිටින අතර ඔහු ඉල්ලා සිටින්නේ 2019.12.17 වන දින සිට වැටුප් සහිතව සේවා තත්ත්වයන්ට අගති රහිතව යලින් සේවය ප්‍රතිෂ්ඨාපිත කරන ලෙස ඔහුගේ ඉල්ලීමෙන් දක්වා ඇත.

දෙවන පාර්ශ්වය සිය විරෝධතාවයෙන් දක්වා සිටින්නේ, ඉල්ලුම්කරු 2019.12.15 දින සිට සේවයට වාර්තා කර නොමැති බවත් 2019.12.20 වන දිනැතිව වහාම සේවයට වාර්තා කරන ලෙසත් එසේ නොමැති නම් පිළිවෙත් ප්‍රකාරව වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලුම්කරු වෙත කඩුවෙල ඩිපෝ අධිකාරිවරයා දැනුම් දී ඇති බව වගඋත්තරකරුගේ විරෝධතා ප්‍රකාශයෙන් දක්වා ඇත. තවද වගඋත්තරකරු දක්වා සිටින්නේ, ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 21.1 විනය නීතිය කඩකල හෙයින් 2020.01.01 සිට සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කරන බව 2020.01.31 වන දින ඉල්ලුම්කරු වෙත දන්වා ඇති බව ඔවුන්ගේ විරෝධතා ප්‍රකාශයෙන් දක්වා ඇති අතර ඒ අනුව ඉල්ලුම්පත්‍රය නිෂ්ප්‍රභ කරන ලෙස දන්වා ඇත.

**සාක්ෂි විශ්ලේෂණය :**

පළවන පාර්ශ්වය විසින් සාක්ෂි ලබා දී ඇති අතර A1 සිට A11 දක්වා ලේඛන ඉදිරිපත් කර ඇත. A1 දරන ලේඛනයෙන් දැක්වෙන්නේ 2018 මාර්තු මස 09 වන දින වේතන වර්ධක ලබා නොදීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරන තැන නිකුත් කරන ලද ලිපියකි. A2 ලෙස දක්වා ඇත්තේ ඉල්ලුම්කරු කොන්දොස්තර තනතුරට ප්‍රතිෂ්ඨාපිත කරන ලෙසට මානව සම්පත්

කළමනාකාර තැන 2015.04.02 වන දින නිකුත් කරන ලද ලිපියයි. A3 ලෙස දක්වා ඇත්තේ සේවා අවශ්‍යතාවය මත පළවන පාර්ශ්වයට කාර්යයන් පැවරීමේ ලිපියයි. A4 ලෙස ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට උසස් කිරීමේ ලිපිය දක්වා ඇත. A5 ලෙස කම්කරු දෙපාර්තමේන්තුව නීති උල්ලංගනය කිරීම සම්බන්ධයෙන් කරන පැමිණිල්ලයි. A8 ලෙස දක්වා ඇත්තේ පළවන පාර්ශ්වය විසින් 2020.01.15 වන දින අසනීප වී ඇති බව දක්වන ලිපියයි. A9 ලෙස වැටුප් විස්තරයක් ඉල්ලුම්කරු විසින් දක්වා ඇත. A10 ලෙස පැමිණීමේ ලේඛනය දක්වා ඇත.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් දෙදෙනෙක් ඉදිරිපත් කරන ලද අතර ප්‍රධාන ලිපිකරු රත්නායක මුදියන්සේලාගේ ශ්‍රියානි පෙරේරා සහ ලිපිකාර ඉන්ද්‍රානි සුසිලා පෙරේරා යන අය මූලික සාක්ෂි සහ හරස් ප්‍රශ්නවලට යටත්ව සාක්ෂි ලබාදුන් අතර ඔවුන් සාක්ෂි දී ඉදිරිපත් කරන ලද ලේඛන වන්නේ, R2 ලෙස දැක්වෙන්නේ පළවන පාර්ශ්වකරුගේ සේවයට බඳවාගැනීමේ ලිපියයි. R3 වන්නේ 1997.01.01 චෝදනා පත්‍රයක් දක්වා ඇත. R4 ලෙස දක්වා ඇත්තේ1997.04.23 වන දින මුදල් වංචාවක් සම්බන්ධයන් ඉදිරිපත් කරන ලද ලිපියකි. R5 ලෙස දක්වා ඇත්තේ තවත් චෝදනා පත්‍රයකි. R6 ලෙස දක්වා ඇත්තේ 1996.06.09 වන දින පළවන පාර්ශ්වයට එරෙහිව තවත් චෝදනා පත්‍රයකි. R7 ලෙස දක්වා ඇත්තේ අනියම් බස් කොන්දොස්තර තනතුරට පත් කිරීම සම්බන්ධ ලේඛනයකි. R8 ලෙස දක්වා ඇත්තේ 2000.03.06 වන දිනැති චෝදනා පත්‍රයකි. R9 ලෙස දක්වා ඇත්තේ 2000.03.05 වන දිනැති චෝදනා පත්‍රයකි. R10 ලෙස දක්වා ඇත්තේ 2000.07.31 දරන චෝදනා පත්‍රයකි. R11 ලෙස දක්වා ඇත්තේ 2000.04.29 දරන චෝදනා පත්‍රයකි. R12 ලෙස දක්වා ඇත්තේ දෙවන පෙළ කොන්දොස්තර තනතුර පත්කිරීම සම්බන්ධයෙන් පත්වීමේ ලිපියකි. R13 ලෙස දක්වා ඇත්තේ පඩි රහිත නිවාඩු ලබා ගැනීම සම්බන්ධව ලේඛනයකි. R14 ලෙස දක්වා ඇත්තේ නැවතත් 2002.03.15 දිනැති චෝදනා පත්‍රයයි. R15 ලෙස දක්වා ඇත්තේ 2003.11.03 චෝදනා පත්‍රයයි. R16 ලෙස ලකුණු කොට ඇත්තේ 2002 පඩි රහිත නිවාඩු ලබා ගැනීමේ ලේඛනයයි. R17 ලෙස ලෙස ලකුණු කොට ඇත්තේ 2006.12.19 දින පඩි රහිත නිවාඩු ලබා ගැනීම සම්බන්ධයන් විනයානුකූල ක්‍රියා කිරීම සම්බන්ධ ලේඛනයකි. R18 ලෙස දක්වා ඇත්තේ පළදායී ලෙස සේවය ලබාදීම අපොහොසත් වීමට අදාල ලේඛනයකි. R19 ලෙස දක්වා ඇත්තේ නැවතත් චෝදනා පත්‍රයකි. R20 ලෙස සඳහන් කර ඇත්තේ වහාම සේවයෙන් පහ කිරීමේ ලේඛනයකි. R21 ලෙස දක්වා ඇත්තේ අභියාචනා නියෝගයයි. R22 ලෙස දක්වා ඇත්තේ සේවය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ දේශපාලන කමිටු තීන්දුවයි. R23 ලෙස දක්වා ඇත්තේ රාගම පර්යන්තයේ වේලා සටහන් පොත් තනතුරට පත්කිරීමයි. R24 ලෙස දක්වා ඇත්තේ 2019.01.31 වන දින ඩිපෝ පරීක්ෂක තනතුරට උසස් කිරීමයි. R25 ලෙස දක්වා ඇත්තේ සේවකයාගේ වැටුප් විස්තර දක්වන පත්‍රිකාවකි. R26 ලෙස දක්වා ඇත්තේ පළවන පාර්ශ්වය වහාම ක්‍රියාත්මක වන පරිදි නිත්‍ය සේවයට බඳවා ගැනීමයි.

මේ අනුව R26 ලේඛනය දක්වා සාක්ෂි ලේඛන විශ්ලේෂණය කර බැලුවොත් දෙවන පාර්ශ්වය විටින් විට චෝදනා පත්‍ර සේවකයාට ඉදිරිපත් කරමින් විටින් විට නැවත සමාව දෙමින් විවිධ අවස්ථාවේදී සේවකයා යලි පහ කරමින් නැවතත් සේවකයා සේවයට බඳවා ගනිමින් ක්‍රියා කරමින් සිටි R26 ලේඛනය අනුව 2019.11.29 වන දින නිත්‍ය සේවයට බඳවාගෙන ඇත. ඒ අනුව R26 ලේඛනයේ සඳහන් පරිදි පළවන පාර්ශ්වය 2019.12.01 වන දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිත්‍ය සේවකයෙකි. මෙම ගරු අධිකණයට සලකා බැලීමට සිදු වන්නේ 2019.12.01 වන විට ඉල්ලුම්කරු නිත්‍ය සේවකයෙක් වන බැවින් R28 ලේඛනය පරිදි 2020.01.01 දින ඔහු සේවය හැරගිය සේවකයෙක් ලෙස සේවා යෝජකයා විසින් සලකා බැලීම සාධාරණ වන්නේද යන්නයි. R29 ලේඛනයේ අවසාන ඡේදයෙන් දක්වා “ඔබ රෝහල්ගත වී නේවාසිකව ප්‍රතිකාර ලබන්නේ නම් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම ප්‍රමාද කල හැකි අතර සුව වූ විගස වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු බවට දක්වා ඇත“ ඒ අනුව R31 ලේඛනයේ සඳහන් ආකාරයට පළවන පාර්ශ්වය විසින් අසනීප වී ඇති බැවින් සුවවූ විගස නැවත සේවයට පැමිණෙන බව දක්වා ඇත.

තවද 2019.12.31 වන දින පළවන පාර්ශ්වය විසින් A34 ලේඛනයේ පරිදි වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරමින් 2019.12.16 දින සිට දින හතරක් වෛද්‍ය ප්‍රතිකාර ලැබීමට සුදුසු බව 2019.12.31 දරන වෛද්‍ය සහතිකයෙන් බෙම්මුල්ල වෛද්‍ය කේ.ඒ.අයි.ජේ. කුරුප්පු යන අය වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇති තවදුරටත් වෛද්‍ය සී.කේ.එස්. දියගල මහතා 2019.12.20 වන දින සිට දින 12ක කාලයක් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය බවට 2019.12.31 දිනැති වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇති අතර එය R35 ලෙස ලකුණු කර ඇත. මේ අනුව මෙම වෛද්‍ය සහතිකය නිසි පරිදි තිබියදී කඩවත ඩිපෝ කළමනාකාරවරයා විසින් 2020.01.01 දින සිට සේවය අතර ගිය බවට R30 දරන ලිපියෙන් පළවන පාර්ශ්වයට දැනුම් දී ඇත. ස්වාභාවික යුක්ති මූලධර්මයක් වන පාර්ශ්වයන්ට කරුණු ඉදිරිපත් කිරීමට එනම් දෙපාර්ශවයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය යුතුය යන ස්වභාවික යුක්ති මූලධර්ම ඩිපෝ කළමනාකාරවරයා R30 දරන ලේඛනයෙන් උල්ලංගනය කොට ඇත. මේ අනුව වෛද්‍ය සහතික ඉදිරිපත්කොට තිබියදී ඉතාමත් ද්වේශසහගත ලෙස ඉල්ලුම්කරු සේවයෙන් නෙරපා ඇති බවට මා මෙයින් තීන්දු කරමි. එසේ හෙයින් මෙය *ගැසට් පත්‍රයේ* පළවී දින 14ක කාලසීමාවක් ඇතුලත පළවන පාර්ශ්වය 2019.12.17 වන දින සිට සේවා තත්ත්වයන්ට අගති රහිතව පසු වැටුප් සහිතව සේවයේ පිහිටුවා ඒ බව නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත දන්වන ලෙස මෙයින් නියෝග කරමි. එසේ වුවද පළවන පාර්ශ්වය ඉල්ලා ඇති වැටුප සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැක්කේ පළවන පාර්ශ්වය විසින් නිසි ලෙස ගරු අධිකරණය වෙත තමන්ගේ වැටුප් වාර්තා ඉදිරිපත් කර ඔප්පු කොට නොමැති බැවිනි. මෙම තීන්දුව යුක්ති සහගත සහ සාධාරණ තීන්දුවක් බව ප්‍රකාශ කරමි.

**නීතිඥ පාලිත සේනාධීර,**
බේරුම්කරු.

2024 අප්‍රේල් මස 08 වැනි දින,

EOG 08 - 0126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.